# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/13 - 2017 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2017.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 25/73

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නීතිඥ දයාසිරි ජයසේකර,
ක්‍රීඩා අමාත්‍ය.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 (2) වැනි නියෝගයේ ''අන්තර්ජාතික ක්‍රීඩා ඒකාබද්ධ සංගමයේ'' යන වචන වෙනුවට ''අන්තර් ජාතික ක්‍රීඩා සම්මේලනයක්, එම සංගමයට ඇත්නම්'' යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) එහි 5 (1) වැනි නියෝගයේ,

(අ) (i) වන අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

''(i) සභාපතිවරයා සහ උපසභාපතිවරයන්, උපසභාපතිවරයන්ගෙන් එක් තැනැත්තකු, කමිටු රැස්වීම්වලදී ඡන්ද අයිතිය භාවිතා කිරීමට අයිතිය නොමැති, අදාළ පාසල් සංගම්වල නියෝජිතයකු විය යුතු ය;'' ;

(ආ) (iii) වන අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

''(iii) භාණ්ඩාගාරිකවරයා, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් මුදල් සමාගමක හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වූ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක හෝ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාපිත සමාගමක ගිණුම් කළමණාකරුවකු හෝ ගිණුම් ලිපිකරුවකු ලෙස අවම වශයෙන් වසරක පළපුරුද්ද ඇති තැනැත්තකු විය යුතු ය; '' ;

(3) එහි 5 (2) වන නියෝගයේ (ii) වන අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

"(ii) වසර හතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා ධූරය දැරිය යුතු අතර, නැවත තෝරා පත් කරගනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද, නිලධරයකු විනය කමිටුව විසින් විනය හේතු මත ඉවත් කරනු නොලැබුවේ නම් මිස නැවත තෝරාපත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය." ;

(4) එහි 5 (4) වන නියෝගයේ :-

(අ) (ඒ) ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඒ) නාම යෝජනා ඉදිරිපත් කිරීමට පෙර වූ වසරක කාල සීමාව තුළ ඔහු එම ජාතික ක්‍රීඩා සංගමයේ විනිශ්චයකාරවරයකු, තීරකයකු, විනිසුරුවරයකු හෝ තනි ක්‍රීඩකයකුගේ හෝ කණ්ඩායමක පුහුණුකරුවකු වශයෙන් කටයුතු කර ඇත්නම්;" ;

(ආ) (ක) ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ක) නාම යෝජනා ඉදිරිපත් කිරීමට පෙර වූ වසරක කාල සීමාව තුළ දී එම ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ යම් අයිතම හෝ උපකරණ අදාළ ජාතික ක්‍රීඩා සංගමයට අලෙවි කිරීමේ හෝ සැපයීමේ යෙදී ඇත්නම් හෝ එම ක්‍රීඩාවට සම්බන්ධව ක්‍රීඩා පුහුණු පාසල් මෙහෙයවීමේ හෝ මුදල් ගෙවීමකට යටත්ව සේවා සැපයීමේ යෙදී ඇත්නම්;" ;

(ඇ) (ට) ඡේදයේ "වසර හතරක" යන වචන වෙනුවට "වසරක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි (ඩ) ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කිරීමෙන් ;

"(ඩ) භාණ්ඩාගාරිකවරයා හෝ සහකාර භාණ්ඩාගාරිකවරයා හැර, එම සංගමය විසින් ලියාපදිංචි කරන ලද, ප්‍රවර්ධනය කරන ලද මෙහෙයවන ලද හෝ අනුමත කරන ලද යම් ප්‍රධාන ක්‍රීඩා තරඟාවලියකදී, ක්‍රීඩා උත්සවයකදී හෝ තරඟයකදී එම අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන්, කණ්ඩායම් ක්‍රීඩාවක් සඳහා වාර දෙකකට වැඩි වාර ගණනක් හෝ යම් තනි ඉසව්වක් සඳහා හෝ ක්‍රීඩාවක් සඳහා එක් වාරයකට වැඩි වාර ගණනක් වෙනුවෙන් සහභාගි වී නොමැතිනම් හෝ ශ්‍රී ලංකාව නියෝජනය කර නොමැති නම්;"

(ඉ) එහි (න) ඡේදයට ඉක්බිතිවම පහත ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ප) කොමිෂන් ලබා දීම අහිමි කරනු ලැබූ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වේ නම් ;

"(බ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ මුදල් විශුද්ධිකරණ වරදට වරදකරු වී සිටීනම්";

(5) එහි 5 (5) නියෝගයට ඉක්බිතිවම පහත අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :-

"(6) සංගමයක සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික යන ධූරයක් දරන යම් තැනැත්තකු වෙනත් යම් සංගමයක සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික යන ධූරය හැර වෙනත් ධූරයක් දැරීමට සුදුස්සකු විය යුතු ය;";

(6) එහි 6 වන නියෝගයේ "(6) මේ නියෝග" යන වචන වෙනුවට "6. මේ නියෝග" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) 7 නියෝගයේ,

(අ) "7. සෑම ජාතික" යන වචන වෙනුවට "7. (1) සෑම ජාතික" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (xiv) අයිතමය ඉවත් කර, පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

"(xiv) (අ) වාර්ෂික මහා සභා රැස්වීමේ දී ජාතික ක්‍රීඩා සංගමයේ කමිටුවේ නිලධරයන් පත්කර ගැනීම සඳහා සහ තීරණ ගැනීමේ කමිටුවේ, වර්ගීකරණ කමිටුවේ හෝ ශ්‍රේණිගත කිරීමේ කමිටුවේ, තාක්ෂණික කමිටුවේ, මුදල් කමිටුවේ සහ විනය කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සඳහා නිලවරණය පැවැත්වීම ;

(ආ) නිලවරණය කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීම ;

(ඇ) තේරීම් කමිටුවේ සාමාජිකයන් තෝරා ගැනීම;";

(ඇ) එහි (xvii) අයිතමයේ "දින හතළිහකට" යන වචන වෙනුවට "දින දාහතරකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි 7(1) නියෝගයට ඉක්බිතිව ම පහත අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

''(2) සෑම ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයකට ම සිය අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ හෝ සංගමයේ ලියාපදිංචි වීමේ බලය තිබිය යුතු ය. එම අදාළ ක්‍රීඩාවේ නියැලී සිටින වෙනත් අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ හෝ අනෙකුත් සංවිධාන අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ හෝ සංගමයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ලැබිය යුතු ය.'' ;

(8) එහි 10 වන නියෝගයේ අර්ථ නිරූපනයේ ''මලල ක්‍රීඩකයා'' යන යෙදුමේ ''මලල ක්‍රීඩකයා'' යන වචන වෙනුවට ''ක්‍රීඩකයා'' යන වචන ආදේශ කිරීමෙන් ;

(9) එම නියෝගවල II වන උපලේඛනයේ ''3. කාය වර්ධනය, 22. ජීවිතාරක්ෂා, 23. බොක්සිං, 37. ආබාධිතයන්ගේ ක්‍රීඩා, තුරඟ තරඟ, 48. කඩු හරඹ, 50. සෙපැක්ටැක්‍රෝ, 52. මොඩර්න් පෙන්ටැක්ලොන්, 55. කෝ-කෝ'' යන වචන වෙනුවට ''3. කාය වර්ධන, 22. ජීවිතාරක්ෂක, 23. බොක්ෂිං, 37. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ක්‍රීඩා, 43. අශ්වාරෝහක, 48. ෆෙන්සින්, 50. සෙපැක්ටැක්රෝ, 52. මොඩර්න් පෙන්ටැත්ලෝන්, 55. කෝ-කෝ'' යන වචන පිළිවෙලින් යෙදීමෙන් ;

(10) එම නියෝගවල III වන උපලේඛනයේ,

(අ) (උ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(ආ) (ග) ඡේදයේ ''පත් කිරීම, ඉවත් කිරීම'' යන වචන වෙනුවට ''පත් කිරීම හෝ තෝරා ගැනීම, ඉවත් කිරීම'' යන වචන ආදේශ කිරීමෙන් ;''

(ඇ) (බ) ඡේදයේ ''මලල ක්‍රීඩක කමිටුවක්'' යන වචන වෙනුවට ''ක්‍රීඩක කමිටුව'' යන වචන ආදේශ කිරීමෙන්'' ;

03 - 15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.